දික්වැල්ල ප්‍රාදේශීය සභාව
මාතර දිස්ත්‍රික්කය
-------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2019 වර්ෂයේ  මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27  දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 08 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින්  වන බලපෑම හැර  මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට  දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව  සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව  මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------- | ------------ | ----------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලද පොලී ආදායම රු.1,403,060 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.2,431,906 ක ශේෂය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවියයුතු දායක මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 123,773,884 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 63,851,806 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.480,135,825 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී යාවත්කාලීනකර, ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 143 | ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙජරය මාසිකව එකතු කර ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජරය ගිණුම සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | තැන්පත් ලේඛනය හා ප්‍රධාන ලෙජර් ගිණුම මාසිකව ගැලපීම් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 21,207,962 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 24,879,324 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,741,924 | 6,509,219 | 7,034,064 | 2,357,524 | 3,330,579 | 3,312,587 | 2,982,033 | 2,882,367 |
| කුලී | 4,690,620 | 7,056,591 | 7,108,042 | 1,600,190 | 4,886,100 | 4,491,445 | 4,691,447 | 1,651,640 |
| බලපත්‍ර ගාස්තු | 1,257,000 | 1,859,646 | 1,859,646 | - | 1,252,500 | 1,340,125 | 1,340,125 | - |
| වෙනත් ආදායම් | 35,055,786 | 32,173,788 | 23,839,199 | 202,750,321 | 19,454,181 | 21,828,643 | 14,954,688 | 194,415,732 |
| එකතුව | 46,745,330 | 47,599,244 | 39,840,951 | 206,708,035 | 28,923,360 | 30,972,800 | 23,698,293 | 198,949,739 |

## 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,768,170 ක් වූ අතර, රු. 3,470,268 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු. 6,238,438ක් අයවිය යුතුව තිබුණි. වර්ෂයේ මුළු අයවීම් රු.3,986,473 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.2,251,965 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |
| **(ආ) අක්කර බදු**<br>ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු. 60,883 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.6,941 ක් විය. වර්ෂය තුලදී මුළු අයවීම් රු. 15,580 ක් වීම නිසා, සමාලෝචිත වර්ෂය අවසානයට රු. 52,245 ක් හිඟව පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කිරීමට කටයුතු කරමි. |

## 2.2.3 වෙනත් ආදායම්

### උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට උසාවි දඩ රු.3,641,820 ක් හා මුද්දර ගාස්තු රු.22,179,566 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් ලබා ගැනීම සඳහා ප්‍රධාන ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා බල ප්‍රදේශය තුළ මාසිකව ජනනය වන ටොන් 40 ක පමණ දිරන කසළ භාවිතා කර දික්වැල්ල මහජන පොළ භූමියේ ස්ථාපිත කර ඇති ජීවවායු ඒකකය හරහා ප්‍රතිචක්‍රීකරණ කටයුතු සැලසුම් කර තිබුණද 2017 වර්ෂයේ සිට මෙය අක්‍රීයව තිබුණි. | ගැටළු විසඳාගෙන ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වා ගත යුතුවේ. | අක්‍රියවූ ජීව වායු ඒකකය සම්බන්ධයෙන් වගකීම දැරිය යුතු ආයතනය කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. |
| (ii) | කසළ බැහැර කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාවලිය නිවැරදිව සිදු නොකිරීම නිසා නොදිරන කසළ සභාව සතු ප්‍රමාණය පර්චස් 40ක විවෘත ඉඩමට බැහැර කර තිබුණි. | කසළ බැහැර කිරීම විධිමත්ව කළ යුතුවේ. | දැනට මෙම ස්ථානයේ කසල රැස් නොකරන බව දන්වමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කෝට්ටගොඩ පාතේගම හන්දියේ සිට උඩුපිටිය මාර්ගයේ ජලනල එලීමේදී පළුදු කරන ලද මාර්ග කොටස් නවීකරණයට අදාළව රු.1,774,650 ක ඇස්තමේන්තුවක් 2016 නොවැම්බර් 15 දින ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා එකී ආයතනයෙන් රු.1,632,150 ක මුදලක් 2017 ඔක්තෝබර් 19 දින සභාවට ලැබී තිබුණි. තවද ජලනල එලීමෙ කටයුතු 2019 මැයි 29 දින අවසන් වී තිබුණ ද අදාළ මාර්ගයේ නවීකරණ කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මාර්ගයේ නවීකරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 18 ක් සම්පූර්ණ කර ගැනීමට හා එක් අතිරික්ත සේවකයෙකු විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ඉල්ලීම් කර ඇත. |
| **(ආ) සේවක ණය** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 08 දෙනෙකුගෙන් අය නොවී පවතින රු.486,434 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් හිඟ ණය ශේෂ අයකර ගත යුතුවේ. | ණය මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අංක 935/6 හා 1996 අගෝස්තු 06 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව කට්ටි කර විකුණන ඉඩම් 02 කින් ප්‍රජා විනෝද කටයුතු සඳහා සභාවට ලැබිය යුතු පර්චස් 42.63 ක ප්‍රමාණයක් අඩුවෙන් ලබාගෙන තිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව ඉඩම් කොටස් සභාවට ලබාගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) අංක 2094 හා 2018ඔක්තෝබර් 10දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව දැන්වීම් පුවුරු සවිකිරීම පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබූ අතර, 2019 දෙසැම්බර් 03දින ක්ෂේත්‍ර පරික්ෂාවේදී ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 81ක් වෙනුවෙන් රු.273,365 ක ගාස්තු අයකර නොතිබුණි. | ගැසට් පත්‍රය ප්‍රකාරව ගාස්තු අයකර යුතුවේ. | අදාල ගාස්තු අයකිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස අ/5/6/ පොදු හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 5 වන වගන්තිය ප්‍රකාරව සභාව සතු පොදු වෙළඳපොළ හා බස් නැවතුම්පොළ කඩ කාමර 37 ක ගිවිසුම් වර්ෂ 03 කට වරක් යාවත්කාලීන කර නොතිබූ අතර 6 වන වගන්තිය ප්‍රකාරව කඩ කාමර 13 ක් වර්ෂ 05 කට වරක් කුලිය තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමණාකරණය**

---------------------------

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු සන්සයිඩ් සිටි නිවාස යෝජනා ක්‍රමයේ පොදු කටයුතු සඳහා ලබාගත් පර්චස් 60 ක ඉඩම් කැබැල්ල අනවසරයෙන් පරිහරණය කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කළ යුතුවේ. | පිඹුරුපත්හි අඩුපාඩු පවතින බැවින් පිනැන්ස් සමාගම වෙත දන්වා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.5.2 පවරා නොගත් වත්කම්**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රුහුණු තෙල් මෝල අසල ළිඳ පිහිටි ඉඩම, උඩදෙණියපාර වෙලේවත්ත පොදු ළිඳ පිහිටි ඉඩම හා සුසානභූමි 28 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළයුතුවේ. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |